SLAB
SRI LANKA ACCREDITATION BOARD

# ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

## වෙළෙඳ වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

# තනතුරු ඇබෑර්තු

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය යනු පරීක්ෂණ/ ක්‍රමාංකන විද්‍යාගාර, වෛද්‍ය රසායනාගාර, පරීක්ෂණ ආයතන සහ අනුකූලතා තක්සේරු කිරීම්වලට සම්බන්ධ වලංගු කිරීමේ ආයතන ප්‍රතීතනය කිරීම සඳහා වගකියනු ලබන, 2005 අංක 32 දරණ පනත යටතේ පිහිටුවා ඇති ශ්‍රී ලංකාව සඳහා වන ජාතික ප්‍රතීතන අධිකාරියයි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වර්තමානයේදී වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙයි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය, ජාත්‍යන්තර ප්‍රතීතන සංසදයේ (IAF) සහ ජාත්‍යන්තර රසායනාගාර ප්‍රතීතන සහයෝගීතාවයේ (ILAC) පූර්ණ සාමාජිකයෙක් වන අතර ප්‍රතීතන ක්‍රම සඳහා ජාත්‍යන්තර පිළිගැනීම ලබා ගෙන ඇත.

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ අනුකූලතා ඇගයීම සඳහා වන පහත දක්වා ඇති තනතුරු සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) - තනතුරු 02

**සුදුසුකම් :-**

**බාහිර:**

1. අ.පො.ස.. (සා/පෙ) විභාගයෙන්
   - i. සිංහල/දෙමළ
   - ii. ඉංග්‍රීසි භාෂාව
   - iii. ගණිතය ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථය ඇතුළුව එක් වරකදී විෂයයන් හයක් සමත් වී තිබීම

සහ

2. විද්‍යාව, ගණිතය, තාක්ෂණය හෝ වාණිජ විෂය ධාරාව යටතේ අ.පො.ස.. (උ/පෙ) විභාගයෙන් එක් වරකදී විෂයයන් තුනකින් සමත් වීම (පොදු ප්‍රශ්න පත්‍රය හැර)

සහ

3. පිළිගත් ආයතනයකින් මාස 06 ක පරිගණක යෙදුම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

පහත සුදුසුකම්වලින් සමන්විත ප්‍රාථමික "පුහුණු, ප්‍රාථමික" අර්ධ පුහුණු සහ ප්‍රාථමික නුපුහුණු කාණ්ඩවල සේවකයන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

**අධ්‍යාපනය :**

අ.පො.ස. (සා/පෙ) විභාගයෙන් i. සිංහල/දෙමළ ii. ඉංග්‍රීසි භාෂාව iii. ගණිතය ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ ඇතුළුව එක් වරකදී විෂයයන් හයක් සමත් වී තිබීම

**වෙනත්**

ඉහත සේවා කාණ්ඩය යටතේ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහ

පිළිගත් ආයතනයකින් මාස 06 ක පරිගණක යෙදුම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

**සටහන:**

ස්ථිර තනතුරකට පත් කිරීමට පෙර සේවා කාලය හෝ ඕනෑම තනතුරකට ස්ථිර පදනමින් පත් කිරීම සඳහා අවශ්‍යතාවයක් ලෙස පුහුණුව තුළ සම්පූර්ණ කළ යුතු සේවා කාලය, ඉහත දක්වා ඇති සුදුසුකම සඳහා වන වසර පහක සේවා කාලය පිළිබඳ අවශ්‍යතාවය සඳහා ගණනය නොකළ යුතු ය. අනියම්/තාවකාලික පදනමින් සේවය කළ සේවා කාලය ද මෙම අරමුණ සඳහා ගණනය නොකළ යුතු ය.

වැටුප් කේතය සහ මාසික වැටුප් පරිමාණය:
MA 1-2 - 2016 - LKR 27,910 - 10x300 - 7x350 - 12x600 - 12x710 = 49,080
බඳවාගැනීමේදී ඔබ රු. 27,910 වැටුප් තලයේ පිහිටවනු ඇත.

**වයස :**

වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**ස්ථිර කිරීම:**

මෙම කාණ්ඩයේ III ශ්‍රේණියට පත්වීම් ලබන බාහිර අපේක්ෂකයකු, රාජකාරි භාරගැනීමේ සිට වසර තුනක පරිවාස කාලයකට යටත් වේ. පරිවාස කාලය තුළ ඔහුගේ/ඇයගේ කාර්ය සාධනය සතුටුදායක නම් සහ 1 වන කාර්යක්ෂමතා කඩ ඉම් විභාගය සමත්වීමෙන් පසුව, පරිවාස කාලය අවසානයේදී ඔහු/ඇය තනතුරේ ස්ථිර කෙරෙනු ලැබේ. දැනටමත් තනතුරේ ස්ථිර කර ඇති අභ්‍යන්තර සේවකයන් වසර එකක වැඩ බැලීමේ කාලයකට යටත් වෙනු ඇත.

**බඳවාගැනීමේ පටිපාටිය:**

ලිඛිත විභාගයක් සහ/හෝ ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය තුළින්

## රියදුරු - තනතුරු 01

**බාහිර:**

උපරිම වශයෙන් දෙවරකදී අවම වශයෙන් සම්මාන දෙකක් (02) සහිතව අ.පො.ස. (සා/පෙ) විභාගයෙන් විෂයයන් හයක් (06) සමත් වීම.

සහ

මෝටර් රථ වාහන කොමසාරිස් ජනරාල් විසින් බර වාහන පැදවීමේ බලපත්‍රය ලබා තිබීම සහ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර (03) ක රියදුරු පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

මෝටර් රථ වාහන කොමසාරිස් ජනරාල් විසින් බර වාහන පැදවීමේ බලපත්‍රය ලබා තිබීම සහ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර තුනක රියදුරු පළපුරුද්ද ලබා තිබීම.

සහ

ප්‍රාථමික නුපුහුණු කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් තිබීම.

වැටුප් කේතය සහ මාසික වැටුප් පරිමාණය:
**PL3 - 2016 - රු. [26,290 –10x270-10 x 300 –10 x 330 - 12 x 350 = රු. 39,490 ]**
බඳවාගැනීමේදී ඔබ රු 26,290 වැටුප් තලයේ පිහිටවනු ඇත.

**වයස :**

වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**ස්ථිර කිරීම:**

මෙම කාණ්ඩයේ III ශ්‍රේණියට පත්වීම් ලබන බාහිර අපේක්ෂකයකු, රාජකාරි භාරගැනීමේ සිට වසර තුනක පරිවාස කාලයකට යටත් වේ. පරිවාස කාලය තුළ ඔහුගේ/ඇයගේ කාර්ය සාධනය සතුටුදායක නම් සහ 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වීමෙන් පසුව, පරිවාස කාලය අවසානයේදී ඔහු/ඇය තනතුරේ ස්ථිර කෙරෙනු ලැබේ. දැනටමත් තනතුරේ ස්ථිර කර ඇති අභ්‍යන්තර සේවකයන් වසර එකක වැඩ බැලීමේ කාලයකට යටත් වෙනු ඇත.

**බඳවාගැනීමේ පටිපාටිය:**

පරීක්ෂණයක් සහ ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයක් තුළින් සිදු කෙරේ.

**වෙනත්**

රජය විසින් අනුමත දීමනාවන් ගෙවනු ලැබේ. සේ.අ.අ. වෙත 15% සහ සේවා.නි.භා.අ. වෙත 3% ක දායකත්වයක් ලබා දෙනු ලැබේ. එමෙන්ම වෛද්‍ය රක්ෂණය සඳහා හිමිකම් ලැබේ.

සෑම අයදුම්කරුවෙක්ම,

- i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
- ii. තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතු ය.
- iii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**අයදුම් කළ යුතු ආකාරය**

**කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)**

සෑම අපේක්ෂකයෙකුම අපගේ නිල වෙබ් අඩවිය වන **www.slab.lk (https://www.slab.lk/career/)** තුළින් අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතු අතර, මාර්ගගතව අයදුම් කිරීමෙන් පසුව නිසි ලෙස සම්පූර්ණ කර බාගත් අයදුම්පත්‍ර **2024.02.28** දින හෝ එයට පෙර අදාළ සහතිකවල පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතු ය. **අයදුම් කරන තනතුර** ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සටහන් කළ යුතු ය. මාර්ගගත අයදුම්පත්‍රය සහ ලියාපදිංචි තැපෑලෙන් එවූ අයදුම්පත්‍රය යන දෙකම අයදුම් කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කළ යුතු ය.

**රියැදුරු**

අයදුම්පත්‍ර, **2024.02.28** දිනට පෙර, සහතික පත්‍රවල පිටපත් සහ ජීව දත්ත පත්‍රය සමග පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. **අයදුම් කරන තනතුර** ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සටහන් කළ යුතු ය. රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය අංශයේ සේවකයන් තම අයදුම්පත්‍රය ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතු ය.

- විස්තරාත්මක දැන්වීම අපගේ නිල වෙබ් අඩවියේ පළ කර ඇත. **(https://www.slab.lk)**

**සභාපති,**
**අනුකූලතා ඇගයීම සඳහා වන ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය,**
**අංක 44, විශේෂ ආර්ථික මධ්‍යස්ථානය, කිරිමණ්ඩල මාවත, නාරාහේන්පිට.**

SELACINE